සැමවිටම දිවි තොර කරගැනීම් හෝ ඊට අදාළ වන මානසික සෞඛ්‍යය සම්බන්ධ වන පුවත් වාර්තාවන් සමඟින්, හදිසි උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය වේ. මන්ද යත්, හදිසි උපකාරක අංක ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩකඩ ලැබෙන හෙයිනි.

ලෝක මානසික සෞඛ්‍ය දිනය (ඔක්.10, 2022) නිමිත්තෙන් ස්වර්ණවාහිනී ලයිව් ඇට් 8 පුවත් විකාශය තුළ, මානසික ආතතිය සහ දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පුවත් වැඩසටහන, දිවි තොර කරගැනීම් වළක්වා ලීම සම්බන්ධයෙන් ධනාත්මක ස්වරයකින් ඉදිරිපත් වී තිබිණි.

කෙසේ නමුත්, මෙහි හදිසි උපකාරක අංක සඳහන්ව නොතිබුණි.

මේ සමඟින් හදිසි උපකාරක අංක ද සඳහන් වූයේ නම්, එය වඩාත් යෝග්‍ය වන්නට තිබුණේ නොවේ ද? එය තවත් එක් ජීවිතයක් හෝ බේරාගැනීමට උපකාරයක් ද නොවන්නේ ද?
උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)